සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.06 / 0830 - 1030

ඉස්ලාම් I
இஸ்லாம் I
Islam I

44 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. අල්ලාහ්ගේ ශුද්ධ නාමයන් අතුරෙන් මැවුම්කරු යන්න හඳුන්වන වචනය කුමක් ද?
(1) අර්රහ්මාන් (2) අර්රස්සාක් (3) අල් කාලික් (4) අල් කුද්දූස් (5) අස්සලාම්

2. පහත සඳහන් අයගෙන් උලුල් අස්මිගෙන් අඩංගු නබි,
(1) ඉස්මායීල් (අලෛ) ය. (2) ඉබ්රාහීම් (අලෛ) ය.
(3) දාවූද් (අලෛ) ය. (4) යූසුෆ් (අලෛ) ය.
(5) නූහ් (අලෛ) ය.

3. උම්මහාතුල් මූඃමිනීන්වරුන් අතුරෙන් වැඩිම සංඛ්‍යාවක් හදීස් ප්‍රකාශ කළේ,
(1) ආයිෂා (රළි) ය. (2) සව්දා (රළි) ය. (3) කදීජා (රළි) ය.
(4) හෆ්සා (රළි) ය. (5) සෛනබ් (රළි) ය.

4. හජ් ඉටුකිරීමේදී ගල් ගැසීමේ චාරිත්‍රය සිදුවන ස්ථානය
(1) කෘබා වේ. (2) මර්වා වේ. (3) සෆා වේ. (4) මිනා වේ. (5) අරෆා වේ.

5. තෆ්සීර් කලාවේ විශේෂඥයින් වන්නේ,
(1) මුහද්දිසීන් ය. (2) මුජ්තහිදීන් ය. (3) මුඅල්ලිමීන් ය. (4) මුජද්දිදීන් ය. (5) මුෆස්සිරීන් ය.

6. පහත සඳහන් දෑ අතුරෙන් අර්කානුල් කියාස්වලට අඩංගු **නොවන්නේ**,
(1) අස්ල් ය. (2) ෆර්උ ය. (3) ඉජ්තිහාද් ය. (4) ඉල්ලත් ය. (5) හුකුම් ය.

7. කුත්බා සමග ඉටු කෙරෙන ෆර්ලු වූ සාමූහික සලාතය
(1) සලාතුල් කුසූෆයින් ය. (2) සලාතුල් ඉස්තිස්කාඋ ය.
(3) සලාතුල් ඊදයින් ය. (4) සලාතුල් ජුම්ආ ය.
(5) සලාතුල් ඉස්තිකාරා ය.

8. අල්-කුර්ආන් ගොනුකිරීමේ ප්‍රයත්නයේදී වැඩි දායකත්වයක් ලබාදුන් සහාබි
(1) මුආද් (රළි) වේ. (2) මුස්අබ් (රළි) වේ.
(3) උස්මාන් (රළි) වේ. (4) සයිද් (රළි) වේ.
(5) ජඃෆර් (රළි) වේ.

9. කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස්තුමාගේ දිරිගැන්වීම යටතේ හදීස් එකලස් කිරීමේ උත්සාහය ආරම්භ කළේ,
(1) ඉමාම් සුහ්රි ය. (2) ඉමාම් සුයූත්ති ය.
(3) ඉමාම් අබූදාවූද් ය. (4) ඉමාම් අබ්දුල්ලා ඉබ්නු මුබාරක් ය.
(5) ඉමාම් ඉබ්නු මාජා ය.

10. සෘජු නීතිමය සාක්ෂි නොලැබූ විටකදී කාලි ස්ව අනුමානවලින් ලබාදෙන තීන්දුව කුමක් ද?
(1) හුදූද් (2) කිසාස් (3) තෘසීර් (4) ජිනායත් (5) කත්ල්

11. 'අල් ජිහාද් බිල් මාල්' හි ඇතුළත් වනුයේ,
(1) අභ්‍යන්තර අරගලයයි. (2) දේශපාලන අරගලයයි.
(3) දේශනා මෙහෙයයි. (4) ජීවිත පරිත්‍යාගයයි.
(5) ධනය පරිත්‍යාගයයි.

12. 'සලාතුල් කුසූෆයින්' සිදුවන අවස්ථාව වන්නේ
(1) ග්‍රහණයන් සිදුවන විටදී ය.
(2) කුසල් අපේක්ෂා කරන විටදී ය.
(3) නියඟය දීර්ඝ වන විටදී ය.
(4) වර්ෂාව අවශ්‍ය විටදී ය.
(5) ඊද් දිනක උදෑසනකදී ය.

13. 'බෛතුල් මක්දිස්' සිට 'බෛතුල්ලාහ්' දෙසට කිබ්ලාව මාරු කිරීමෙන් සිහි ගන්වන මස්ජිදය
(1) මස්ජිද් නම්රා ය.
(2) මස්ජිදුල් හරාම් ය.
(3) මස්ජිදුල් කිබ්ලතෛන් ය.
(4) මස්ජිදු කුබා ය.
(5) මස්ජිදුන් නබවි ය.

14. කසපහර දඬුවම ලබාදෙන වැරදි දෙකක් වන්නේ,
(1) පරපුරුෂ/පරස්ත්‍රී සේවනය හා සොරකම ය.
(2) ඝාතනය හා මුර්තද් ය.
(3) සොරකම හා ඝාතනය ය.
(4) මත්ද්‍රව්‍ය පරිභෝජනය කිරීම හා අපවාදය ය.
(5) මංකොල්ලය හා පරපුරුෂ/පරස්ත්‍රී සේවනය ය.

15. පහත අය අතුරෙන් අජ්නබි වන්නේ,
(1) මාමාගේ දුව ය.
(2) මවගේ සහෝදරිය ය.
(3) පුතාගේ බිරිඳ ය.
(4) බිරිඳගේ මව ය.
(5) පියාගේ දුව ය.

16. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් අනුගමනය කරන අකීදා කණ්ඩායම වන්නේ,
(1) තහාවියියා වේ.
(2) මුඃතසිලා වේ.
(3) අෂ්අරියා වේ.
(4) ජෟෆරියියා වේ.
(5) මාද්රූදියියා වේ.

17. මතභේදවලින් තොරව සියලුදෙනා විසින් පිළිගත් ඉජ්මා
(1) ඉජ්මා සුකූත්ති ය.
(2) ඉජ්මා සරීහ් ය.
(3) ඉජ්මා අක්සරියියා ය.
(4) ඉජ්මා නක්ලි ය.
(5) ඉජ්මා ඉජ්තිහාදි ය.

18. පහත සඳහන් අය අතුරෙන් සහාබි **නොවන** අය
(1) හසන් බස්රි වේ.
(2) බිලාල් හබෂි වේ.
(3) සුහයිබ් රූමි වේ.
(4) සල්මාන් ෆාර්සි වේ.
(5) අබූදර් කිෆාරි වේ.

19. නබි මූසා (අලෛ) නබි ඉබ්රාහීම් (අලෛ) යන අයට එරෙහිව කටයුතු කළ රජවරුන් පිළිවෙළින්
(1) ජාලූත් සහ ෆිර්අව්න් ය.
(2) නම්රූද් සහ අසීස් ය.
(3) බල්කීස් සහ ෆිර්අව්න් ය.
(4) නම්රූද් සහ ජාලූත් ය.
(5) ෆිර්අව්න් සහ නම්රූද් ය.

20. ඉමාමුල් ඇලම් ලෙස ද ඉමාමුල් මදීනා ලෙස ද හැඳින් වූ ඉමාම්වරු දෙදෙනා පිළිවෙළින්
(1) අබූහනීෆා සහ මාලික් ය.
(2) බුහාරි සහ මුස්ලිම් ය.
(3) ෂාෆිඊ සහ හනෆි ය.
(4) කුර්තුබි සහ ජව්සි ය.
(5) නසඊ සහ තිර්මිදි ය.

21. පහත සූරාවන් අතුරෙන් 'තර්තීබ් තිලාවත්' පිළිවෙලට සැකසී ඇති සූරාවන් වනුයේ,
(1) ෆාතිහා, ඉක්ලාස් සහ අන්නාස් ය.
(2) ඉක්ලාස්, ෆලක් සහ අන්නාස් ය.
(3) බකරා, ෆාතිහා සහ නිසාඋ ය.
(4) යාසීන්, මුල්ක් සහ හෂ්ර් ය.
(5) අලක්, මුද්දස්සීර් සහ මුස්සම්මිල් ය.

22. මියගිය ස්වාමිපුරුෂයා වෙනුවෙන් භාර්යාව 'ඉද්දාහ්' සිටීමට වඩාත් සුදුසු කාරණය කුමක් ද?
(1) ශෝකය ප්‍රකාශ කිරීම
(2) ඉවසීම පුරුදු වීම
(3) ස්වාමිපුරුෂයා වෙනුවෙන් යාඥා කිරීම
(4) පිළිසිඳ ගැනීම තහවුරු කිරීම
(5) අල්ලාහ්ගේ නියෝගය ඉෂ්ට කිරීම

23. සුන්නත් සවුම් සමාදන් වීම තහනම් කළ දිනයන්
(1) ෂව්වාල් 2, 3 ය.
(2) මුහර්රම් 9, 10 ය.
(3) දුල්හජ් 11, 12 ය.
(4) ෂඃබාන් 14, 15 ය.
(5) රජබ් 27, 28 ය.

More Past Papers at
tamilguru.lk

24. උම්රා ඉටුකිරීමේ පිළිවෙළ පෙන්නුම් කරන වරණය කුමක් ද?
(1) සඊ, ඉහ්රාම්, හිස බූ ගෑම, තවාෆ්
(2) තවාෆ්, හිස බූ ගෑම, සඊ, ඉහ්රාම්
(3) හිස බූ ගෑම, තවාෆ්, ඉහ්රාම්, සඊ
(4) ඉහ්රාම්, තවාෆ්, සඊ, හිස බූ ගෑම
(5) ඉහ්රාම්, සඊ, හිස බූ ගෑම, තවාෆ්

[තුන්වැනි පිටුව බලන්න.

**25.** අල්ලාහ්ගේ ගුණාංග සඳහන් වරණය තෝරන්න.
(1) ජාහිලූන්, ෆනාඋන්, අජ්දූන්, මව්තුන්
(2) කදීමුන්, වාහිදුන්, කාදිරුන්, හයියුන්
(3) කියානත්, කිත්බුන්, බලාදත්, කිත්මාන්
(4) පතානත්, ඉල්මුන්, කිත්බුන්, ෆනාඋන්
(5) පතානත්, සිද්කුන්, තබ්ලීක්, අමානත්

**26.** වුළු ඉටුකිරීමට පිරිසිදු ජලය ලැබීම
(1) සුන්නත් (2) ෆර්ලු (3) වාජිබ් (4) ෂර්ත්තු (5) මක්රූහ්

**27.** අබුජහ්ල් පහත දැක්වෙන කුමන කණ්ඩායමට අයත් ද?
(1) මූර්තද් (2) මුනාෆික් (3) මුස්ලිම් (4) මුල්හිද් (5) මුෂ්රික්

**28.** නබිතුමාගේ පුතෙකු මෙන් හදාගත්තේ කවුරුන් ද?
(1) කාසිම් (2) සයිද් (3) ඉබ්රාහීම් (4) අලි (5) අබ්දුල්ලාහ්

**29.** පහත අංගවලින්, අලුත විවාහ පත් යුවලකට ආශීර්වාද කරන දුආ වන්නේ,
(1) ෂෆාක්කල්ලාහ් ය. (2) ෆී අමානිල්ලාහ් ය.
(3) බාරකල්ලාහ් බිකුම් ය. (4) ජසාකල්ලාහු කයිරන් ය.
(5) ඉන්ෂා අල්ලාහ් ය.

**30.** ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන පුනරුදය සඳහා පාසල් පිහිට වූ පුරෝගාමිකයා කවු ද?
(1) එම්. සී. සිද්දිලෙබ්බෙ (2) කසාවත්ත ආලිම් (3) එම්. ටී. අක්බර්
(4) ආලිමුල් අරූස් (5) සර් රාසික් පරීද්

**31.** ඉමාම් බුහාරි (රහ්) මුහද්දිස්වරුන් අතුරින් ශ්‍රේෂ්ඨයෙකු ලෙස ගැනීමට හේතුව,
(1) හදීස් එක්රැස් කිරීම ය. (2) හදීස් ක්ෂේත්‍රයේ ශිෂ්‍යයන් බිහිකිරීම ය.
(3) සහීහ් බුහාරි ගොනු කිරීම ය. (4) හදීස් සුපරීක්ෂාකොට වර්ග කිරීම ය.
(5) බොහෝ ප්‍රදේශවලට ගොස් හදීස් එක්රැස් කිරීම ය.

**32.** මුජ්තහිද් මුතලක් යන තත්වයේ සිටින ඉමාම්වරු දෙදෙනා වන්නේ,
(1) ඔෆසායි සහ ළාහිරි ය. (2) මාලික් සහ ෂාෆිඊ ය.
(3) සුයුත්ති සහ කුර්තුබි ය. (4) දාරමි සහ බයිහකි ය.
(5) ෂයිබානි සහ අබූ යූසුෆ් ය.

- අංක **33** සිට **36** තෙක් ප්‍රශ්නවලට අදාළ ව **X** හා **Y** යටතේ දී ඇති තොරතුරු කිසියම් ආකාරයකින් එකිනෙකට සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව **Y** තීරුවේ ඇති ඒවා, **X** තීරුවේ ඇති ඒවා සමඟ නිවැරදි අනුපිළිවෙළින් ගළපා ඇති වරණය තෝරන්න.

**33.**

| X | Y |
|---|---|
| (i) යව්මුල් බඃස් | A – විනිශ්චය ලබාදෙන දිනය |
| (ii) යව්මුල් හිසාබ් | B – එක්රැස් කරනු ලබන දිනය |
| (iii) යව්මුද්දීන් | C – වගවීම් දිනය |
| (iv) යම්මුල් හෂ්ර් | D – නැගිට්ටුවන දිනය |

(1) A B C D (2) A C B D (3) B A C D (4) C D A B (5) D C A B

**34.**

| X | Y |
|---|---|
| (i) කෆාඅත් | A – විවාහවීමට අවසර ලද පුද්ගලයා |
| (ii) අජ්නබි | B – මනමාලිගේ පියා |
| (iii) මහ්රම් | C – විවාහයට අවසර නොලද පුද්ගලයා |
| (iv) වලි | D – ගැලපීම |

(1) A B C D (2) A C D B (3) B C D A (4) C D A B (5) D A C B

**35.**

| X | Y |
|---|---|
| (i) ඉල්මුන් | A – ශක්තිමත් තැනැත්තා |
| (ii) බසීරුන් | B – මරණය |
| (iii) කාදිරුන් | C – දැනුම |
| (iv) මව්තුන් | D – බලන්නා |

(1) A B C D (2) A D C B (3) B C D A (4) C D A B (5) D B A C

| | X | | Y |
|---|---|---|---|
| **36.** | (i) ඉල්මුල් හදීස් | | A – ඉමාම් මුස්ලිම් |
| | (ii) ඉල්මුත් තෆ්සීර් | | B – ඉමාම් ෂාෆිර් |
| | (iii) ඉල්මුල් ෆික්හ් | | C – ඉමාම් රාසි |
| | (iv) ඉල්මුල් අඛාඉද් | | D – ඉමාම් අෂ්අරි |

(1) A B C D (2) A C B D (3) A D B C (4) B C D A (5) C D A B

**37.** පහත දැක්වෙන කරුණුවලට අවධානය යොමු කරන්න.
A - මෙලොව සහ එලොව දෙකටම මග පෙන්වයි.
B - ලෝකය පිළිබඳව සියලු දැ අත්හැර ජීවත්වීමට මග පෙන්වයි.
C - ජීවිතයේ සෑම අංශයකටම මග පෙන්වයි.
D - නම්‍යශීලී ගතියෙන් යුක්ත නොවේ.
E - පදනම් මූලාශ්‍රවලින් යුක්ත වේ.
F - මිනිසාගේ උත්සාහයෙන් පමණක් බිහි විය.
ඉහත සඳහන් කරුණුවලින් ඉස්ලාම් හි විශේෂ ලක්ෂණ ඇතුළත් කාණ්ඩය
(1) A, B හා C ය. (2) A, C හා E ය. (3) B, C හා D ය. (4) B, D හා F ය. (5) C, D හා E ය.

**38.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - දුආ උල් ඉෆ්තිතාහ් පාරායනය
B - රුකූඋ හි තස්බීහ් කිරීම
C - වුලූඋ කිරීම
D - ඉඃතිකාෆ් රැඳී සිටීම
E - සලවාත්හි අස්හාබු ඇතුළත් කිරීම
ඉහත සඳහන් කරුණු වලින් සලාත හි සුන්නත් ඇතුළත් කොටස
(1) A, B හා C ය. (2) A, B හා E ය. (3) B, C හා D ය. (4) C, D හා E ය. (5) D, E හා C ය.

**39.** මිනිසා ඉටුකළ යුතු ඉබාදත්, කිලාෆත්, ඉමාරත් කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.
A - අල්ලාහ්ගේ නියෝගයන් පිළිපැදීම
B - ජල සම්පත් අපිරිසිදු කිරීම
C - පරිසරය අලංකාර කිරීම
D - දෙමව්පියන්ගේ යුතුකම් ඉටු කිරීම
E - රජයට විශ්වාසවන්තව කටයුතු කිරීම
F - සලාතය හා සව්මය යුතුකම් ඉටු කිරීම
ඉහත ප්‍රකාශවලින් ඉබාදත්වලට සම්බන්ධ ක්‍රියා නම්
(1) A, B හා C ය. (2) A, D හා F ය. (3) B, C හා D ය. (4) C, D හා F ය. (5) D, E හා F ය.

**40.** පුද්ගලයෙක් ත්‍රිරෝද රථයක නැග නියමිත දුරක් ගමන් කිරීමෙන් පසු කිසියම් මුදල් ප්‍රමාණයක් රියදුරුට ගෙව්වේ ය. මෙම ක්‍රියාව
(1) අල්බයිඋ ය. (2) සම්සරා ය. (3) අල්කර්ල් ය. (4) අල්ඉජාරා ය. (5) අර්රිබා ය.

**41.** එක් පාර්ශ්වයක් මූලධනය සැපයීම හා අනෙක් පාර්ශ්වය ශ්‍රමය ලබාදීම පදනම් කරගෙන සිදුකරන ව්‍යාපාරික ගනුදෙනුව
(1) මුසාරආ ය. (2) සලම් ය. (3) මුෂාරකා ය.
(4) මුලාරබා ය. (5) බයිඋල් මුඅජ්ජල් ය.

**42.** පාපක්‍රියා කෙරෙහි යොමුවේදෝ යන බියෙන් සැක සහිත දෙයින් **වැලකී** සිටීම
(1) තස්කියා ය. (2) තක්වා ය. (3) සුහ්දු ය. (4) වරඋ ය. (5) තව්බා ය.

**43.** මුඃතසිලා සංවිධානයේ නිර්මාතෘ ලෙස සැලකෙන්නේ කවු ද?
(1) වාසිල් බින් අදා (2) අබුල් හසන් අෂ්අරි
(3) අබ්දුල් කාදිර් ජීලානි (4) කස්සාලි
(5) සර්හින්දි

**44.** ශ්‍රී ලංකාවට ඉස්ලාම් පණිවිඩය ගෙනා තැනැත්තා කවු ද?
(1) ඉබ්නු බතූතා (2) ඉබ්නු ෂහ්රයාර්
(3) වහබ් ඉබ්නු හබ්සා (4) කාලිද් බින් බකායා
(5) මාප්පිල්ලෙ ආලිම්

**45.** මනමාලියක් වීමට සුදුසුකම් නොලත් තැනැත්තිය කවුරුන් ද?
(1) මුස්ලිම්වරයෙක්ව සිටින්නා (2) ස්ත්‍රියක්ව සිටින්නා
(3) අජ්නබි වී සිටින්නා (4) පතිනිවත රකින්නා
(5) තවත් කෙනෙකුගේ බිරිඳක්ව සිටින්නා

● අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2) , (3) , (4) , (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යෙදුම් යුගලය සහිත වරණය තෝරා, එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමුවන ප්‍රකාශය තවත් පැහැදිලි කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **46.** | ඊමාන් සහ අමල් එකිනෙක බද්ධ වී පැවතීමට නොහැකි | ෆර්ලු අයින්, ෆර්ලු කිෆායා යන දෙක සියලුදෙනා විසින් වෙන් වෙන්ව අනිවාර්යයෙන් ඉටු කළ යුතු වන්නේ ය. |
| **47.** | ඉල්හාත් සංකල්පය ඉස්ලාමික ආරම්භක යුගයේ දකින්නට තිබුණි. | අබ්දුල්ලා ඉබ්නු උබෛ මුනාෆික්වරුන්ගේ කෙනෙක් වේ. |
| **48.** | කවාරිජ්වරු සිෆ්ෆීන් යුද්ධයේදී බිහිවූවන් ය. | මක්කී, මදනී වචනවල අර්ථ සහ අඩංගු දේ එක සමාන ය. |
| **49.** | අයි.එල්.එම් අබ්දුල් අසීස් සිද්දිලෙබ්බේගේ සේවාව තවදුරටත් ගෙන ගියේ ය. | හදීස්වල මුතවාත්තිර් හදීස් විශ්වාස කළ හැකි ඒවා ය. |
| **50.** | "ඔබ එකිනෙකා වග කිව යුත්තන් ඔබගේ වගකීම ගැන මතු ලෝකයේදී විමසනු ඇත." යන්න හදීස් වේ. | රජයේ සේවයේ යෙදී සිටින්නන් නියමිත වේලාවට පැමිණීම හා නියමිත රාජකාරිය ඉටුකිරීම වගකීමකි. |

* * *

More Past Papers at
tamilguru.lk

0905

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | |
|---|---|
| ඉස්ලාම් | II |
| இஸ்லாம் | II |
| Islam | II |

**44 S II**

**2018.08.07 / 0830 - 1140**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** පහත දැක්වෙන එක් එක් වචන යුගල අතර පවතින වෙනස දක්වන්න.
   (i) තව්හීද් රුබූබියියා - තව්හීදුල් උලූහියියා
   (ii) ෂිර්ක් අක්බර් - ෂිර්ක් අස්කර්
   (iii) කදරියියා - ජබරියියා
   (iv) මුඃතසිලා - අෂ්අරියියා

**2.** මුස්ලිම් සමාජ ව්‍යුහයේ සහ සමාජ සුබසාධනයේ, පහත දැක්වෙන ඒවායෙහි ඇති භූමිකා පැහැදිලි කරන්න.
   (i) ජමාඅත් සලාතය
   (ii) සකාත්
   (iii) විවාහය
   (iv) උරුමය

**3.** පහත සඳහන් අය ඉස්ලාම් දහමට ඉටු කළ දායකත්වය කෙටියෙන් විස්තර කරන්න.
   (i) වරකතිබ්නු නව්ෆල්
   (ii) ඉමාම් ෂාෆිඊ
   (iii) අබුල් හසන් අෂ්අරී
   (iv) එම්.සී. සිද්දිලෙබ්බේ

More Past Papers at
tamilguru.lk

## II කොටස

**4.** (i) වහි යනු කුමක් ද?
   (ii) නබි (සල්) තුමාට පළමුවන වහි පහළ කළ ආකාරය විස්තර කරන්න.
   (iii) අල්-කුර්ආන් සංග්‍රහ කිරීමේදී කලීෆා අබූබකර් (රලි) යුගයේ තිබූ ප්‍රයත්න විස්තර කරන්න.
   (iv) කලීෆා උස්මාන් (රලි)තුමා 'ජාමිඋල් කුර්ආන්' යනුවෙන් හැඳින්වීමට හේතුව විස්තර කරන්න.

**5.** (i) හරාම්, හලාල් යන්න අර්ථ දක්වා ස්වාභාවිකව සහ ලබාගැනීමේ ක්‍රම අනුව හරාම් බවට පත් කර ඇති ආහාර ද්‍රව්‍ය වර්ගීකරණය කොට දක්වන්න.
   (ii) හරාම් ආහාර ද්‍රව්‍ය භාවිතයෙන් වැලකිය යුත්තේ කුමන හේතු නිසා දැයි යන්න විස්තර කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

**6.** (i) ඉස්ලාම් ධර්මයේ ආර්ථික ක්‍රමයට අනුව වෙළෙඳාම හා පොලිය අතර පවතින වෙනස්කම් විස්තර කරන්න.
(ii) සේවා වෘත්තියෙහි අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත ලෙස ඉස්ලාම් ආගමෙහි සඳහන් කර ඇති කරුණු විස්තර කරන්න.

**7.** (i) ඉජ්තිහාද් යනු කුමක් ද? ඉජ්තිහාද් ඇකිය යුතු අවශ්‍යතාවය කුමන අවස්ථාවේ මතුවේ ද යන්න ඓතිහාසික සාධක සහිතව ගෙනහැර දක්වන්න.
(ii) ඉජ්මා සහ කියාස් භාවිත කරන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

**8.** (i) අධ්‍යාත්මික අභිවෘද්ධිය සඳහා ඇති ක්‍රමවේද පැහැදිලි කරන්න.
(ii) තව්බා යනු කුමක් ද යන්න පැහැදිලි කොට එය පිළිගැනීමට ඇති ක්‍රම විස්තර කරන්න.

* * *